# PUBLIC ECONOMY
# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# බාහිරතා

බාහිරතා යනු කිසියම් නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවක් නිසා වෙනත් පාර්ශ්වයක් මත ඇති කරන, නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවට සෘජුව ම සම්බන්ධ අය විසින් සැලකිල්ලට නොගන්නා ප්‍රතිලාභ හෝ පිරිවැයයි.

## බාහිර පිරිවැය

වෙනත් පාර්ශ්වයක් වෙත ඇති කරන අහිතකර ප්‍රතිවිපාක බාහිර පිරිවැයක් ලෙස සලකනු ලැබේ.

## බාහිර ප්‍රතිලාභ

වෙනත් පාර්ශ්වයක් වෙත ඇති කරන හිතකර ප්‍රතිවිපාක බාහිර ප්‍රතිලාභ ලෙස සලකනු ලැබේ.

ClassWork.LK

බාහිරතා හිතකර ප්‍රතිවිපාක හෝ අහිතකර ප්‍රතිවිපාක ලෙස ස්වරූප දෙකක් පවතී.

හිතකර ප්‍රතිවිපාක ධන බාහිරතා ලෙසත් අහිතකර ප්‍රතිවිපාක සෘණ බාහිරතා ලෙසත් වර්ග කෙරේ.

බාහිරතා අසල්වැසි ප්‍රතිවිපාක හෝ තෙවැනි පාර්ශව ප්‍රතිවිපාක ලෙස ද හඳුන්වයි.

ClassWork.LK

## බාහිරතා උපදවන මූලාශ්‍ර

බාහිරතා උපදවන මූලාශ්‍ර දෙකකි.

1. නිෂ්පාදනය

2. පරිභෝජනය

## බාහිරතා ප්‍රභේද

ඉහත මූලාශ්‍ර මත හට ගන්නා බාහිරතා ප්‍රභේද 4කි. ඒවා නම්,

- නිෂ්පාදනයේ ඍණ බාහිරතා
- නිෂ්පාදනයේ ධන බාහිරතා
- පාරිභෝජනයේ ඍණ බාහිරතා
- පාරිභෝජනයේ ධන බාහිරතා

ClassWork.LK

# නිෂ්පාදනයේ සෘණ බාහිරතා

නිෂ්පාදනයේ සෘණ බාහිරතා යනු කිසියම් නිෂ්පාදන කටයුත්තක් නිසා ඊට සෘජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන අවාසි හෙවත් අයහපත් බලපෑම් ය.

**නිදසුන් :**

- අර්තාපල් බෝග නිෂ්පාදනයේ දී පාංශු බාදනය නිසා ජලාශවල රොන් මඩ තැන්පත් වීම නිසා සිදු වන හානිකර තත්ත්වය

- කෘෂි බෝග සඳහා කෘමිනාශක භාවිතය හේතුවෙන් පරිසරය දූෂණය වීම හා ලෙඩ රෝග ඇති වීම

ClassWork.LK

# නිෂ්පාදනයේ ධන බාහිරතා

නිෂ්පාදනයේ ධන බාහිරතා යනු කිසියම් කෘෂි නිෂ්පාදන කටයුත්තක් නිසා ඊට සෘජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන වාසි හෙවත් යහපත් බලපෑම් ය.

**නිදසුන් :**

- මුල් උද්‍යානයක් ඇති කිරීමෙන් මී මැසි පාලනයේ ඵලදායිතාව වැඩි වීම

- වන වගා ව්‍යාපෘතිය නිසා ජල මූලාශ්‍ර ඇති වීම

Class Work LK

# පරිභෝජනයේ සෘණ බාහිරතා

පරිභෝජනයේ සෘණ බාහිරතා යනු කිසියම් පරිභෝජන කටයුත්තක් නිසා එයට සෘජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන අවාසි හෙවත් අහිතකර බලපෑම් ය.

**නිදසුන් :**

- දුම්පානය නිසා අවට සිටින පුද්ගලයන් ඇති වෙන අහිතකර බලපෑම

- මෝටර් රථ භාවිතයෙන් පිටවන කාබන් ඩයොක්සයිඩ් වායුව නිසා සමාජයට අහිතකර බලපෑම් ඇති වීම

ClassWork.LK

# පරිභෝජනයයේ ධන බාහිරතා

පරිභෝජනයයේ ධන බාහිරතා යනු කිසියම් පරිභෝජන කටයුත්තක් නිසා එයට සෘජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන වාසි හෙවත් හිතකර බලපෑම් ය.

**නිදසුන් :**

- බෝ වන රෝග සඳහා ලබා දෙන එන්නත් මගින් සියලු ම දෙනාට හිතකර බලපෑම් ඇති වීම
- දෙමුහුන් වාහන (හයිබ්‍රීඩ්) භාවිතයෙන් සමාජයට සහ පරිසරයට වන හිතකර බලපෑම

ClassWork.LK

කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් නිසා එහි සියලු ම පිරිවැය නිෂ්පාදකයා විසින් දරන්නේ නම් හෝ කිසියම් පරිභෝජන කටයුත්තක් නිසා එහි සියලු ම ප්‍රතිලාභ එම පාරිභෝගිකයාට හිමි වන්නේ නම් වෙළෙඳපොළ කාර්යක්ෂම වේ. නමුත් බාහිරතා නිසා එය එසේ සිදු නොවේ.

බාහිරතා නිසා පෞද්ගලික පිරිවැය හා සමාජ පිරිවැය අතරත් පෞද්ගලික ප්‍රතිලාභ හා සමාජ ප්‍රතිලාභ අතරත් වෙනසක් ඇති වෙයි.

පෞද්ගලික පිරිවැය නිෂ්පාදකයා සෘජුව ම සම්බන්ධ වීමෙන් දරන අතර පෞද්ගලික ප්‍රතිලාභ සෘජුව ම සම්බන්ධ වන පාර්ශ්ව වෙත හිමි වේ.

Class Work.Lk

## බාහිර පිරිවැය

බාහිර පිරිවැය යනු කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් හෝ පරිභෝජන ක්‍රියාවලියක් හෝ නිසා බාහිර පාර්ශ්වයන්ට දැරීමට සිදු වන පිරිවැය වන අතර එම පිරිවැය අදාළ නිෂ්පාදන කටයුත්තට සම්බන්ධ නැති බාහිර කණ්ඩායම් විසින් දරනු ලැබේ.

## සමාජ පිරිවැය

කිසියම් නිෂ්පාදන කටයුත්තක් හෝ පරිභෝජන කටයුත්තක් හෝ නිසා සමස්ත සමාජය විසින් දරන පිරිවැය සමාජ පිරිවැය ලෙස හඳුන්වයි.

පෞද්ගලික පිරිවැයට බාහිර පිරිවැය ගැළපීමෙන් සමාජ පිරිවැය තීරණය වේ.

සමාජ පිරිවැය = පෞද්ගලික පිරිවැය + බාහිර පිරිවැය

ClassWork.LK

## බාහිර ප්‍රතිලාභ

බාහිර ප්‍රතිලාභ යනු කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් හෝ පරිභෝජන ක්‍රියාවලියක් නිසා බාහිර පාර්ශ්වයන්ට ලැබෙන ප්‍රතිලාභයක් වන අතර ඒ වෙනුවෙන් ගෙවීමක් සිදු නොකරයි.

## සමාජ ප්‍රතිලාභ

පෞද්ගලික ප්‍රතිලාභවලට බාහිර ප්‍රතිලාභ ගැළපීමෙන් සමාජ ප්‍රතිලාභ තීරණය වේ.

| |
|---|
| සමාජ ප්‍රතිලාභ = පෞද්ගලික ප්‍රතිලාභ + බාහිර ප්‍රතිලාභ |

Classwork.LK

ආර්ථිකයේ සමාජ පිරිවැය හා පෞද්ගලික පිරිවැය අතර වෙනසක් පවතී නම් හෝ සමාජ ප්‍රතිලාභ හා පෞද්ගලික ප්‍රතිලාභ අතර වෙනසක් පවතී නම් හෝ මිල යාන්ත්‍රනය මඟින් සමාජයේ ප්‍රශස්ත ලෙස සම්පත් බෙදාහැරීමක් සිදු නොවේ.

පූර්ණ තරගකාරී වෙළෙඳපොළක සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ඉටු වන්නේ මිල, ආන්තික පිරිවැයට සමාන වන (MC = P) අවස්ථාවල දී ය.


එසේ නොවන අවස්ථාවල සමාජයේ ප්‍රශස්ත මට්ටමෙන් සම්පත් බෙදීයාමක් සිදු නොවේ.

බාහිරතා ධනාත්මක හෝ ඍණාත්මක හෝ කවර ස්වරූපයක් ගනු ලැබුව ද ඒවායේ ප්‍රතිඵලය වන්නේ සමාජ පිරිවැය හා පෞද්ගලික පිරිවැය අතර නොගැළපීමක් ඇති කිරීම හෝ සමාජ ප්‍රතිලාභ හෝ පෞද්ගලික ප්‍රතිලාභ අතර නොගැළපීමක් ඇති කිරීම යි.

ClassWork.LK

# නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය

නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.




ClassWork.LK

ප්‍රස්තාර සටහනේ MPC වක්‍රය ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රය වන අතර MSC වක්‍රය ආන්තික සමාජ පිරිවැය වක්‍රය වේ.

භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම MPB වක්‍රයෙන් පෙන්නුම් කෙරේ.

වෙළෙඳපොළ ක්‍රමයක ආන්තික සමාජ ප්‍රතිලාභ වක්‍රය (MSB) හා ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වක්‍රය එක සමාන වේ.

සමාජය සතු සම්පත් ප්‍රශස්ත ලෙස බෙදා වෙන් කරනුයේ ආන්තික සමාජ පිරිවැය ආන්තික සමාජ ප්‍රතිලාභවලට සමාන (E1* වන ලෙස නිෂ්පාදනය සිදු වේ නම් ය.

පෞද්ගලික නිෂ්පාදනයේ සෘණ බාහිරතා ඇති වන විට ආන්තික සමාජ පිරිවැය ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යනු ඇත.

ClassWork.LK


ප්‍රස්තාර සටහනේ ආන්තික සමාජ පිරිවැය (MCS) වක්‍රය ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රයට (MPC) ඉහළින් පෙන්නුම් කෙරේ.

ප්‍රස්ථාර සටහනේ පෞද්ගලික නිමැවම් මට්ටම (වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම) (Qp) සමාජීය ප්‍රශස්ත නිමැවුම් මට්ටම (Qs) ඉක්මවා පවතී (අධිනිෂ්පාදනයක් ඇති වේ).

ClassWork.LK

# නිෂ්පාදනයේ ධන බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය

නිෂ්පාදනයේ ධන බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.




ClassWork.LK

නිෂ්පාදන ධන බාහිරතාවක දී පෞද්ගලික නිමැවුම් මට්ටම සමාජීය ප්‍රශස්ත නිමැවුම් මට්ටමට වඩා අඩු වේ (ඌන නිෂ්පාදනයක් පවතී).

ඉල්ලම් වක්‍රය මගින් (MPB) පෙන්නුම් කරන්නේ පාරිභෝගිකයන් තම පෞද්ගලික ප්‍රතිලාභ මත ඉල්ලුම තීරණය ගන්නා ආකාරය යි.


ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රය ආන්තික සමාජ පිරිවැය වක්‍රය ඉක්මවා පවතී.

ප්‍රශස්ත නිමැවුම් මට්ටම තීරණය වන්නේ ආන්තික සමාජ පිරිවැය වක්‍රය ආන්තික සමාජ ප්‍රතිලාභ වක්‍රය ඡේදනය වන ලක්ෂ්‍ය පෙන්නුම් කරන QS ලක්ෂ්‍යයේ දී ය.

ClassWork.LK

# පරිභෝජනයේ සෘණ බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය

පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.




ClassWork.LK

ඉහත දැක්වෙන ප්‍රස්තාර සටහනින් ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ MPB වක්‍රය මගින් පෙන්නුම් කරන අතර ආන්තික සමාජ ප්‍රතිලාභය MSB වක්‍රය මගින් පෙන්නුම් කරයි.

සැපයුම් වක්‍රය මගින් පෙන්නුම් කරනුයේ පෞද්ගලික ආන්තික පිරිවැය වක්‍රය යි.

ඉහත භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයා එමගින් පෞද්ගලික පිරිවැය පමණක් සැලකිල්ලට ගන්නා අතර ඔවුන්ගේ පරිභෝජන මට්ටම $Q_P$ මගින් පෙන්නුම් කෙරේ.


එහෙත් සමාජ ප්‍රශස්ත මට්ටම වන්නේ $Q_S$ ප්‍රමාණය වේ. මිල යාන්ත්‍රනය මගින් සමාජ ප්‍රශස්ත පරිභෝජන මට්ටම පෙන්නුම් නොකරන නිසා අධි පරිභෝජනයක් ඇති වේ.

එමගින් සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවක් පෙන්නුම් කෙරේ.

ClassWork.LK

# පරිභෝජනයේ ධන බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය

පරිභෝජනයේ ධන බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.




ClassWork.LK

පරිභෝජනයේ ධන බාහිරතා පවතින විට සමාජ ආන්තික ප්‍රතිලාභ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යනු ඇත.

එහි දී වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටමට වඩා අඩු ප්‍රමාණයක් වේ.

ClassWork.LK

# <u>බාහිරතා නිසා ඇති වන වෙළෙඳපොළ බිඳවැටීම් මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග</u>

බාහිරතා නිසා ඇති වන වෙළෙඳපොළ බිඳවැටීම් මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක් වේ.

- පාරිසරික බදු පැනවීම
- බලපත්‍ර නිකුත් කිරීම
- ධන බාහිරතා සඳහා සහනාධාර ලබා දීම
- පෞද්ගලික කේවල් කිරීම
- රජය මගින් දඩ නියම කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura